







A Street Car Named Desire
ආශාවේ වීදිරිය

අමරිකන් ජාතික ප්‍රමුඛතම නාට්‍යවේදියෙකු වූ ටෙනසී විලියම්ස් ගේ ප්‍රශස්තම වේදිකා නාට්‍ය රචනය ලෙස සැලකෙන, වර්ෂ 1948 දී "පුලිට්සර්" සම්මානයෙන් ද පිදුම් ලද, "ඒ ස්ට්‍රීට්කා(ර්) නේම්ඩ් ඩිසය(ර්)" නමැති වේදිකා නාට්‍යයේ සිංහල පරිවර්තනය" ආශාවේ වීදිරිය" නමින් වර්ෂ 2016 දී ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය වී රාජ්‍ය නාට්‍ය උත්සවයේ අවසන් වටය නියෝජනය කරමින් වේදිකා ගත විය. ඒ නාට්‍යය පරිවර්තනය කර අධ්‍යක්ෂණය කරනු ලැබුවේ සිනුවර වෙසෙන මහ වෙදගේ චම්ප ප්‍රෂ්ප බුද්ධිපාල නමි කෘතහස්ත නාට්‍යවේදියා විසිනි. චම්ප බුද්ධිපාල විසින් රචනා කොට අධ්‍යක්ෂණය කරන ලද නෙත්කලු නර්තන යෙන් ද, කන්කලු සංගීතයෙන් ද, මතරම් ගායනයෙන් ද, ළබැඳි දෙබසින් ද, සුපිරි රංග නයෙන් ද පිරුණු "ශ්‍රිෂ්ණා" (2002), "දස්කොන්" (2013) සහ "මෙත්තාරා" (2014) වේදිකා නාට්‍යයන් පිළිබඳ සොඳුරු මතක සටහන් තවමත් අප සිත් සතන් තුළ විටින් විට රමණීය දසුන් මවමින් රැඳී පවතී. ඒ නාට්‍යත්‍රයෙන් "දස්කොන්" සහ "මෙත්තාරා" යන නාට්‍ය ද්වය ශ්‍රී ලංකාවේ ද නිෂ්පාදනය කෙරුණු අතර, එයින් 2015 රාජ්‍ය නාට්‍යය උළෙල සඳහා ඉදිරිපත් කරන ලද "මෙත්තාරා" නිර්මාණයට සම්මාන කිහිපයක් ද ලැබුණි. ස්වතන්ත්‍ර නිර්මාණ වූ ඔහුගේ මුල් වේදිකා නාට්‍යත්‍රය මෙන් නොව, පරිවර්තිත "ආශාවේ වීදිරිය" නාට්‍යය නිෂ්පාදනය කෙරුණේ ඕස්ට්‍රේලියාවේ දී නොව ශ්‍රී ලංකාවේ දී වීම නිසා, චම්ප බුද්ධිපාල නාට්‍යවේදියාගේ මේ සිව්වන නිර්මාණය තවමත් අපට නැරඹීමට අවස්ථාවක් නොලැබීම නම් මහත් වූ අවාසනාවකි.

එසේ වුව ද, "ආශාවේ වීදිරිය" (නාට්‍යයේ පෙළ යැයි සාමාන්‍යයෙන් නාට්‍ය බසෙන් හැඳින්වෙන) නාට්‍ය පිටපත මුද්‍රිත කෘතියක් ලෙසින් ලංකාවේ දී 2017 වසරේ දී ප්‍රකාශයට පත් වී ඇති අතර එහි පිටපත් මේ වන විට අප අතරට ද ළඟා වී ඇත. "ආශාවේ වීදිරිය" නාට්‍ය පිටපත් කෘතිය පසුගිය වසරේ (2017) සැප්තැම්බරයේ දී පැවති රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ දී හොඳම පරිවර්තන නාට්‍ය කෘතිය ලෙස සම්මානය සඳහා නිර්දේශිත වූ ග්‍රන්ථ ත්‍රිත්වය අතර වූ බව ද සඳහන් කළ යුතු ය. වෙනත් භාෂාවකින් සිංහල භාෂාවට පරිවර්තනය වූ කෘති කියවීමේ දී අප බොහෝ දෙනෙකු අපූරු වින්දනයක් ලබමු. නිසැකව ම, එයට මූලික හේතුව වන්නේ අප එදිනෙදා දකින, අසන, අත් විඳින, වටපිටාව, පරිසරය සහ චරිත සහ සිදුවීම් යනාදියෙන් සෑහෙන දුරට වෙනස් වූ අංගෝපාංග පරිවර්තන කෘතියක ඇතුළත්වන නිසා ය. පරිවර්තන කෘතියක් කියවීමේ දී අප ලබන ඒ අපූරු වින්දනය මම "ආගන්තුක චමත්කාරය" ලෙස නම් කරමි. නිර්මාණයක් එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තන කිරීම යනු ස්වතන්ත්‍ර නිර්මාණයක් කිරීමට වඩා අසීරු කර්තව්‍යයක් යැයි මම සිතමි. ඒ සඳහා අවශ්‍ය වනුයේ ද්විභාෂා ප්‍රවීණත්වයක් පමණක් නොවේ. අදාළ කෘතියේ අන්තර්ගත සමාජ, ආර්ථික, දේශපාලනික පසුබිම පිළිබඳව ද පුළුල් අවබෝධයක් පරිවර්තක යා සතුවීම අත්‍යාවශ්‍ය වන අතර, කෘතියේ අන්තර්ගතයට අමතරව පෙර කී පුළුල් අවබෝධය ඒ තරමින් නොමැති පාඨක පිරිසකට අදාළ තොරතුරු පරිවර්තනය තුළින් හැකිතාක් දුරට සම්ප්‍රේෂණය කළ යුතු ද වේ. ග්‍රන්ථ පරිවර්තනයේ දී සමහරු වචනයෙන් වචනයට එක් බසකින් අනෙකට පෙරළන කරන ක්‍රමවේදයක් අනුගමනය කරන අතර එහිදී මුල් භාෂාවේ වාක්‍යවලින් ද, වාක්‍ය එකතු කර සැදී ඇති පරිච්ඡේද වලින් ද, සමස්තයක් ලෙස කියවෙන දේ එවැනි පරිවර්තන කියවද්දී ඇතැම් විට සිනා උපදීම වැළැක්විය නොහැකි ය. ඉහත ප්‍රශ්න වළක්වා ගැනීමට පළපුරුදු පරිවර්තකයින් භාවිතා කරන්නේ වචනයෙන් වචනයට පරිවර්තනය කරනු වෙනුවට හැකි තරම් මුල් වචන, වාක්‍ය, ඡේද ආකෘතිය සුරකිමින්, මුල් භාෂාවේ ඇති සමස්ත අදහස දැක්වෙන ආකාරයට දෙවන භාෂාවේ ඇති භාෂා ප්‍රයෝග, උපමා, උපමේය, යෙදුම්, පිරුළු යනාදිය භාවිතා කරන ක්‍රමවේදයකි.

මෙහි අනෙක් අන්තයට යන සමහර පරිවර්තකයින් මුල් කෘතියේ ඇති ස්ථාන නාම සහ පුද්ගල නාම ද, ඇතැම් සිදුවීම් ද, දෙවන භාෂාවට අදාළ වෙන පරිදි වෙනස් කරති. නමුත් එවිට සිදුවන්නේ විදෙස් භාෂාවකින්, බොහෝ විට විදෙස් පරිසරයක් පදනම් කරගෙන ලියවෙන කෘතියකින් ලබා ගත හැකි පෙර කී "ආගන්තුක චමත්කාරය" පාඨකයාට අහිමි වීමයි!

හොඳ පරිවර්තකයෙකු යනු, මේ අන්ත දෙකෙන් ම මිදී මුල් කෘතියේ අන්තර්ගතයට සහ ආකෘතියට අර්ථානුරූපවන ක්‍රමවේදයක් අනුගමනය කරන්නෙකි. පරිවර්තන

ඒ ආකාරයෙන් ම දෙවෙනි භාෂාවෙන් සම්ප්‍රේෂණය නොවීමට ද, එසේ වුවත් හෝ එසේ නොමැති වුවත් හෝ, පරිවර්තනය කෘතිම රළු ස්වරූපයක් ගැනීමට ද ඉඩ ඇත. සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ඇතැම් කෘතිවල එන දෙබස් පවා අතිශය ව්‍යාකරණානුකූලව ලියා තිබෙනු අප දැක ඇත්තෙමු. සාමාන්‍ය සිංහල කතා බහේ දී (මම ගයමි / අපි ගයමු යනාදී) ව්‍යාකරණ භාවිතා නොකෙරෙන නිසා, කෘතියක් කියවා එහි අන්තර්ගතය පිළිබඳව මුල් කෘතියෙන් ස්වායත්තව පොදුවේ කතාබස් කළ හැකි වුව ද, පරිවර්තනයේ සාර්ථකත්වය පිළිබඳව විචාරයක් කිරීම නම්, කෘතියක් දෙවන බසකට පරිවර්තනය කිරීම සේ ම, පහසු කාර්යයක් නොවේ. එයට හේතුව වන්නේ බොහෝ විට ඒ මුල් කෘතිය අප කියවා නැති නිසා ය. මුල් කෘතිය කියවා ඇති අයෙකු එහි පරිවර්තනයක් කියවීමට පෙළඹෙන්නේ ද ඉතාමත් කලාතුරකිනි. "ආශාවේ වීදිරිය" සිංහල කෘතියේ චම්ප බුද්ධිපාල පරිවර්තන කර්තව්‍යයේ තත්වය පිළිබඳව යම් අදහසක් ඇතිකර ගැනීම පිණිස මා කළේ මේ පරිවර්තනයට පාදක කරගෙන ඇති එහි මුල් කෘතිය වන ටෙනසී විලියම්ස් ගේ "ඒ ස්ට්‍රීට්කා(ර්) නේම්ඩ් ඩිසය(ර්)" වේදිකා නාට්‍යයේ ලෝරන්ස් ඔලිවියර් විසින් කරන ලද ලන්ඩන් නිෂ්පාදනය සඳහා යෙදා ගන්නා ලදැයි පැවසෙන 1959 පෙන්ගුවින් සංස්කරණයේ පිටපත් සොයා ගැනීමට තැත් කිරීමයි. ගූගල් පොත් එකතුවක තිබී මුල් කෘතියේ එකී සංස්කරණයේ මුල් පිටු කිහිපයක් පමණක් කියවීමට මට හැකි විය. ඒ සන්සන්දනාත්මක කියවීමේ දී මට පැහැදිලි වූයේ පරිවර්තකයෙකු ලෙස චම්ප බුද්ධිපාල තම කාර්යය මුල් කෘතියේ අන්තර්ගතයට සහ ආකෘතියට අර්ථානුරූපවන ආකාරයට ම කර ඇති බවයි. වසර ගණනාවක් තිස්සේ වේදිකා නළුවෙකු මෙන් ම, නාට්‍යවේදියෙකු ලෙස ද, ද්විභාෂා පරිශීලකයෙකු ලෙස ද තමන් ලබා ඇති වෘත්තිමය පරිචයට අමතරව ඒ කාර්යය සඳහා චම්ප බුද්ධිපාලට සහය වූ කරුණු දෙකක් ඇතැයි මම සිතමි. ඇත්තටම ඒ කරුණු පරිවර්තකයෙකු හමුවේ ඇති අභියෝග ලෙස ද සැලකිය හැකිය. ඉන් පළමුවැන්න නම්, මුල් කෘතියේ එන ස්ථාන, වස්තු සහ පුද්ගල නාම කිසිවක් වෙනස් නොකළ යුතු බව, මුල් නිර්මාණයේ අයිතිය ඇති ආයතන විසින් පනවා ඇති කොන්දේසියයි. දෙවැන්න නම්, මෙය නාට්‍යයක පෙළ රැගත් ග්‍රන්ථයක් නිසා, එහි අඩංගු පරිසර වර්ණනා, චරිත විස්තර සහ රංග විධාන හැරුණු කොට එහි ඇත්තේ සම්පූර්ණයෙන් ම දෙබස් පමණක් වීමයි. එ නිසා, මා පෙර කී ආගන්තුක චමත්කාරය සිංහල පාඨකයාට ලබා දෙමින් ම, විශ්වාසනීයත්වයක් ඇති කරවන, තාත්වික, සිංහලාකාර දෙබස් තම පරිවර්තනයට ඇතුළත් කරමින් ඉංග්ලිෂ් භාෂාවෙන් සිංහල භාෂාවට සාර්ථක පරිවර්තනයක් සිදුකිරීමට චම්ප බුද්ධිපාල නාට්‍යවේදියාට හැකි වී තිබේ. ස්වතන්ත්‍ර මෙන්ම පරිවර්තනය වූ නාට්‍ය පිටපත් ලංකාවේ නිරතුරු ප්‍රකාශනය වෙන බව, ඒ ශානරය සඳහා සුවිශේෂී රාජ්‍ය සම්මානයක් වෙන් කර තිබීමෙන් ම පැහැදිලි වේ. එසේ වෙතත්, රංග කලාව, නාට්‍ය නිෂ්පාදනය මෙන්ම ඒ හා සම්බන්ධ වෙනත් සම්භාව්‍ය ග්‍රන්ථ ඉංග්ලිෂ් භාෂාවෙන් සිංහලට එතරම් පරිවර්තනය වී නොමැති බව මට පසුගිය දා දැනගන්නට ලැබුණි. තම ප්‍රථම පරිවර්තනයෙන් ම රාජ්‍ය සම්මාන සඳහා නිර්දේශ ලද චම්ප බුද්ධිපාල නාට්‍යවේදියාගේ අවධානය ඒ ආකාරයේ පරිවර්තන කර්තව්‍යයන් වෙත ද අනාගයේ දී යොමු වෙතැයි මම බලාපොරොත්තු වෙමි. අවසාන වශයෙන්, "ආශාවේ වීදිරිය" නාට්‍යය සිනුවර දී නරඹන්නටත්, නාට්‍ය පෙළ සහිත කෘතියේ සිනුවර දොරට වැඩුමට සහභාගීවීමටත් ඉතා නුදුරු දිනකදී අපට ඉඩ ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමි.

රසික සූරියආරච්චි
rasika.suriyaarachchi@gmail.com